**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - 2015**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සහ 2017 ජුනි 19 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද ගණුදෙනු පිළිබඳ වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර විගණන මතය සඳහා පදනම**

**--------------------------------------------**

මාගේ වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 අහිතකර විගණන මතය**

**----------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

**-------------------------------**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39

----------------------------------

ප්‍රමිතයේ 46 ඡේදය ප්‍රකාරව, මූල්‍ය වත්කම් සාධාරණ අගයට මැනුම් කර ගිණුම්ගත කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.7,431,000 ක් වූ ස්ථාවර තැන්පතුවල සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව ජීව විද්‍යාත්මක වත්කම් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී සාධාරණ අගයට ගිණුම්ගත කර ඇති බව දක්වා තිබුණද, සාධාරණ අගය මැනුම් කිරීමකින් තොරව 2012 වර්ෂයේ පැවති වටිනාකම වූ රු.3,312,160,200 ක අගයටම සමාලෝචිත වර්ෂය අවසානයට ජීව විද්‍යාත්මක වත්කම් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, භූමිය සංවර්ධනය කිරීම වෙනුවෙන් දරන ලද වියදම් සඳහා ක්ෂය ගැලපීම් සිදුකල යුතු වුවත් වතුයායන් 07 කට අදාලව ප්‍රාග්ධනිත කර තිබූ රු.4,577,424 ක් සඳහා ක්ෂය ගැලපීම් සිදුකර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ හුන්නස්ගිරිය වතුයාය විසින් ණයට අලෙවි කර තිබුණු රු.2,114,910 ක් වූ තේ දළු ආදායම ගිණුම් මගින් සම්පූර්ණයෙන්ම අත්හැරී තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම හා ණයගැති වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල වලහන්දූව වතුයාය විසින් නව රබර් වගාවන් වෙනුවෙන් රු.2,856,805 ක වටිනාකමක් වැයකර තිබියදී එය රබර් වගාව යටතේ ප්‍රාග්ධනිත නොකර වෙනත් වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම්ගත කර තිබූ ක්ෂය හා ක්‍රමක්ෂය වියදම රු.10,763,864 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට අනුව එම වටිනාකම රු.11,319,728 ක් ලෙස ගැලපීම් කර තිබුණි. ඒ අනුව මෙහෙයුම් කටයුතුවල මුදල් ප්‍රවාහය රු.555,864 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ හලාවත වැවිලි සමාගමට ගෙවිය යුතු රු.1,600,000 ක පොලී මුදල සමාලෝචිත වර්ෂයේදී ගෙවා නොතිබූ අතර, එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කටයුතු යටතේ මුදල් ගලායෑම් ලෙස සටහන් වී තිබුණි. ඒ හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති විලම්භිත වත්කම් වටිනාකමින් වෙනත් වගාවන් වෙත මාරුකළ රු.7,915,698 ක වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස සටහන් කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී රු.136,034,936 ක් පාරිතෝෂික වගකීම් පියවීම සඳහා ගෙවා තිබුණද, එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.132,373,652 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වල මුදල් ප්‍රවාහය රු.3,661,284 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොළිය රු.617,920 ක් වුවද සංස්ථාව විසින් රු.398,767 ක් පමණක් පොළි ආදායම ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.219,153 කින් පොලී ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වටිනාකම රු.1,020,448 ක් වූ ස්ථාවර තැන්පතු වටිනාකම ගිණුම් මගින් සම්පූර්ණයෙන් අත්හැරී තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලද රු. 204,000,000 ක පුනරාවර්තන ප්‍රදාන ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් ලෙස හඳුනාගැනීම වෙනුවට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ ප්‍රාග්ධන සංචිත යටතේ දක්වා තිබුණි.

(ඒ) වතුයායන් විසින් අනෙකුත් වතුයාන් සමග ගණුදෙනු සිදුකිරීමේදී එම ගණුදෙනු නිවැරදිව ගිණුම්ගත නොකිරීම හේතුවෙන් හඳුනානොගත් හර ශේෂ රු.1,746,402 ක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

--------------------------------

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට හා රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට ගෙවිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.96,041,073 ක් හා රු.28,709,029 ක් වුවද, අදාල ආයතනයන්හි අවසන් ගිණුම් හා ශේෂ සනාථන ලිපි අනුව එම අගය පිළිවෙලින් රු.119,362,386 ක් හා රු.28,471,183 ක් විය. තවද ඇල්කඩුව වැවිලි සමාගමෙන් ලැබිය යුතු මුදල රු.1,743,955 ක් වුවද, එම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.1,768,749 ක් විය.

### 2.2.5 අවිනිශ්චිත ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.75,789 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමකින් තොරව ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි | 804,946,313 | (i). ස්ථාවර වත්කම් ලේඛනය<br>(ii). ඉඩම් වලට අදාල පිඹුරුපත් |
| (ආ) | වාහන, යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා ගෘහභාණ්ඩ | 279,092,699 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ඇ) | ජීව විද්‍යාත්මක වත්කම් | 3,448,357,991 | (i) වාර්ෂික දැව තක්සේරු වාර්තා<br>(ii) දැව සංගණන හා තක්සේරු වාර්තා |
| (ඈ) | වෙළඳ හා වෙනත් ලැබිය යුතු ගිණුම් | 86,246,139 | ණයගැති කාල විශ්ලේෂණය/ශේෂ සනාථන |
| (ඉ) | අලකොල්ල හා මිඩ්ලන්ඩ් වතුයායන්හි පාරිතෝෂික වගකීම් | 120,608,118 | ගෙවිය යුතු පාරිතෝෂික ලේඛනය |
| (ඊ) | ගෙවිය යුතු වෙළඳ ගිණුම් | 415,140,461 | ණයහිමි කාල විශ්ලේෂණය/ ශේෂ සනාථන |